රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 29/2011(II)

මගේ අංකය: EST-3/DICIP/06/0166
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2017.02.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 24:3 උප වගන්තිය යටතේ විශ්‍රාමික නිලධරයා විධිමත් විනය පරීක්ෂණයේ දී වරදකරු වන අවස්ථාවේ දඬුවම් පැනවීම**

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 24:3 උප වගන්තියට 24:3:14 හා 24:3:15 උප වගන්ති ඇතුළත් කරමින් නිකුත් කරන ලද 2011.12.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2011 සහ එකී චක්‍රලේඛයේ සංශෝධන බලපැවැත්විය යුතු දිනය සඳහන් කරමින් නිකුත් කරන ලද 2012.08.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2011(I) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛ අවලංගු කිරීමට 2017.01.17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. ඒ අනුව, විනය නියෝගයකට යටත් වූ රාජ්‍ය නිලධරයන්ගෙන් එකී චක්‍රලේඛ විධිවිධාන පරිදි අයකරනු ලැබ ඇති මුදල් එම නිලධරයන්ට ආපසු ගෙවීමට කටයුතු කළ යුතුය.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය